AL/2016/42/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | | | |
|---|---|---|---|
| **හින්දු ධර්මය** I<br>இந்து சமயம் I<br>Hinduism I | **42** | **S** | **I** |

**පැය දෙකයි**
இரண்டு மணித்தியாலம்
**Two hours**

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එහි **අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) යොදා දක්වන්න.

---

● අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කුමක් හෝ හේතුවක් නිසා අනෙකුත් ඒවා සමග නොගැළපේ. එම **නොගැළපෙන** කරුණ තෝරන්න.

1. (1) විනායගර් (2) එලුත්තානි තබා ගෙන සිටින අත (3) මෝදගම්
   (4) ඩමරුගම් (5) අමුදකලසම්

2. (1) උඩැක්කිය (2) තාම්පුරාව (3) වීණාව (4) බටනලාව (5) පරයිමේලම්

3. (1) සාංගියම් (2) ජෛනම් (3) වේදාන්තම් (4) න්‍යායම් (5) ශෛවසිද්ධාන්තම්

4. (1) අයිස්වර්යම් (2) බලය (3) වීර්යය (4) තේජස (5) යෝගම්

5. (1) කඩෛයිත්සුවාමිහල් (2) සෙල්ලප්පා සුවාමිහල් (3) ශිවවාක්කියර්
   (4) නවනාද සිත්තර් (5) සිත්තානෛක්කුට්ටි සුවාමිහල්

● අංක **6** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ පද යුගල පහ බැගින් දී ඇත. ඒවායින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම **නොගැළපෙන** පද යුගලය තෝරන්න.

6. (1) සාංගියම් - කබිලර් (2) කේවලාත්තුවිදම් - සංකරර්
   (3) තුවයිදම් - මත්තුවර් (4) යෝගම් - පදංජලි
   (5) විසිට්ටාත්වෛදම් - වල්ලබර්

7. (1) ශ්‍රීභාෂ්‍යම් - ප්‍රභත්ති
   (2) තිරුවාසිරියම් - නම්මාල්වාර්
   (3) මාමල්ලපුරම් - 1 වැනි රාජරාජචෝල
   (4) ශිවානන්ද නර්තනය - ආනන්ද කුමාරස්වාමි
   (5) යාල්නූල් - විපුලානන්දර්

8. (1) උමාපති සිවාචාරියාර් - තිරුවරුට්පයන් (2) කාලිදාසර් - සාගුන්තලම්
   (3) රාජේන්ද්‍ර චෝල - වානවන් මාදේවීෂ්වරම් (4) හරප්පා - සර්. ජොන් මාර්ෂල්
   (5) සිම්ම විෂ්ණු - මදුරෛ මීනාට්චියම්මන්

9. (1) ඍග් වේදය - අයිදරේය ප්‍රාමණම්
   (2) අදර්වවේදය - සාමවිදාන ප්‍රාමණම්
   (3) ක්‍රිෂ්ණයසුර්වේදය - තෛත්තිරිය ප්‍රාමණම්
   (4) සුක්කිලයසුර්වේදය - සදපද ප්‍රාමණම්
   (5) සාමවේදය - සාන්දෝක්‍ය ප්‍රාමණම්

10. (1) රාමායනය - කාණ්ඩ 07ක් සහ ශ්ලෝක 2400
    (2) අදර්වේදය - කාණ්ඩ 20ක් සහ සුක්ත 731
    (3) සාමවේදය - ගීතිකා 1649
    (4) යජුර්වේදය - සාඛෛ 101
    (5) ඍග්වේදය - මණ්ඩල 10 සුක්ත 1028

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයේ '**අ**' තීරුව සහ '**ආ**' තීරුව යටතේ කරුණු කිහිපයක් දී ඇත. '**ආ**' තීරුවේ ඒවා '**අ**' තීරුවට අනුව ගළපා ඇති වරණය තෝරන්න.

11.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) මහේන්ද්‍ර වර්මන් | A - සංකර භක්තන් |
| (ii) පරමේසුවර වර්මන් | B - සිවවාද සේකරන් |
| (iii) 2 වැනි නරසිම්මවර්මන් | C - ඡේදකාරි |
| (iv) 3 වැනි සිම්මවර්මන් | D - විද්‍යාවිනීතන් |
| (v) චෝල රජු | E - අයියඩිහල් කාඩවර්කෝන් |

(1) A D E C B (2) C D A E B (3) C D B E A (4) C E D A B (5) E D A B C

12.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) ශිවපුරානන්දන් | A - හතරයි |
| (ii) විෂ්ණුපුරානන්දන් | B - එකයි |
| (iii) අග්නිපුරාණම් | C - දෙකයි |
| (iv) සූරියපුරාණම් | D - එකයි |
| (v) බ්‍රමපුරාණම් | E - දහයයි |

(1) B D C A E (2) B D E A C (3) B E A C D (4) D B A C E (5) E A B D C

13.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) මැවීම | A - මෝදගම් ඇති අත |
| (ii) රැක ගැනීම | B - අමුදකලසම් |
| (iii) විනාශ කිරීම | C - පාසම් ඇති අත |
| (iv) පිහිටවීම | D - එලුත්තානි තබා ගෙන ඇති අත |
| (v) වසා තැබීම | E - අංගුසම් ඔසවා ගෙන ඇති අත |

(1) A D E C B (2) C E D A B (3) D A E B C (4) D B A C E (5) D E A B C

14.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) ඉන්දීය වෙදකමේ පියා | A - තන්වන්දිරි |
| (ii) ඉන්දීය ශල්‍යකර්මයේ පියා | B - සභාපති |
| (iii) සෙගරාසසේගර මාලයි | C - සුශ්රුදර් |
| (iv) සන්ධාන තීබිගයි | D - රාමලිංග මුනිවරයා |
| (v) සන්ධානමණි | E - සෝමසන්මා |

(1) A C E B D (2) A C E D B (3) A E C D B (4) B D C A E (5) C B D E A

15.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) උසස් ධර්මය වන්නේ ආචාර ධර්මයි | A - මුණ්ඩක උපනිෂද් |
| (ii) ස්වධර්මවේ නිදනම් සිරේයහි | B - මහාභාරතම් |
| (iii) උසස් ධර්මය වන්නේ අහිංසාවයි | C - මනුස්මිරුදි |
| (iv) සත්‍යම් ඒව ජයදේ | D - තෛත්රිය උපනිෂද් |
| (v) සත්‍යම්වද ධර්මම් සර | E - භගවත්ගීතාව |

(1) A B C E D (2) B E C A D (3) C E B A D (4) D E B C A (5) E B A C D

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව දී ඇති පිළිතුරු අතුරෙන් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

16. 'කරගම්' යන්නට යෙදෙන තවත් නමක් වන්නේ,
(1) පූම්පන්දල් (2) කාවඩි (3) අනුමාර්වසන්දන්
(4) අඩික්කු (5) කොම්බුමුරි

17. වෛශ්නව ආගම පැහැදිලි කරන පංජ ශමශ්කාර වන්දනාවට ඇතුළත් **නොවන්නේ,**
(1) මුද්‍රා පැලඳීම ය. (2) තිරුමන්කාප්පු ය. (3) තිරුමන්ද උබදේශම් ය.
(4) තිරුවාරාධනම් ය. (5) තරමසුලෝහම් ය.

18. සෑම පරිච්ඡේදයක් ම 'ඕම් නාරායනාය නමස්කිරුදය' යනුවෙන් ආරම්භ වන ග්‍රන්ථය
(1) රාමායනය ය. (2) මහාභාරතම් ය.
(3) අයිදරේය ප්‍රාමණම් ය. (4) විෂ්ණු පුරාණම් ය.
(5) මහා නාරයන උපනිෂද් ය.

19. ග්‍රාමීය දෙවිවරුන් පමණක් ඇතුළත් කාණ්ඩය,
   (1) කන්නගි අම්මන්, නාච්චිමාර්, පෙරියතම්බිරාන්, මාරියම්මන්
   (2) කන්නගි අම්මන්, මනෝන්මනී නාච්චිමාර්, බෛරවර්
   (3) නාච්චිමාර්, පෙරියතම්බිරාන්, වීර පත්තිරර්, පුවනේශ්වරි
   (4) මාරියම්මන්, අයියනාර්, දක්ෂිණාමූර්ති, පෙරියතම්බිරාන්
   (5) කල්‍යාණ සුන්දරර්, කාලි, කන්නගි අම්මන්, නාච්චිමාර්

20. ශ්‍රී ලංකාවේ 'කණ්ඩන' ග්‍රන්ථ රචනා කළ අය දැක්වෙන කාණ්ඩය,
   (1) ආරුමුග නාවලර්, ඥානප්‍රගාසර්, කාසිවාසි සෙන්දිනාදයියර්
   (2) සංකරපණ්ඩිදර්, සී. වයි. තාමෝදරම් පිල්ලෙයි, ඥානප්‍රගාසර්
   (3) ආරුමුග නාවලර්, කාසිවාසි සෙන්දිනාදයියර්, මේලයි පුලෝලි නා. කදිරවේට්පිල්ලෙයි
   (4) සංකර පණ්ඩිදර්, ඥාන ප්‍රගාසර්, ආරුමුග නාවලර්
   (5) මු. තිරුවිලංග තේසිගර්, ස්වාමිනාද පණ්ඩිදර්, ආරුමුග නාවලර්

21. මත්තුවර්ගේ වේදාන්ත මතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) ඊශ්වරන්, සීවන් යනුවෙන් අභ්‍යන්තර අදහස් දෙකක් ඇති බව පිළිගනී.
   (2) ශෛව ආගම ආශ්‍රිත දාර්ශනික මතයයි.
   (3) ත්වෛද සංකල්ප ග්‍රන්ථවල කාණ්ඩ සර්වමූලම් නම් වේ.
   (4) ත්වෛද වේදාන්තයේ මූලික පදනම පේදාපේද වාදය වේ.
   (5) ත්වෛද වේදාන්තය ක්‍රි.ව. 8-9 සියවස්වල සංකල්පයක් ලෙස බිහිවූවකි.

22. ශ්‍රී ලංකාවේ 20 වැනි සියවසේ බිහි වූ හිංදු ආගමික පුවත්පත් කාණ්ඩය,
   (1) ශෛවක්කාවලන්, මෙයිකණ්ඩාර් නෙරි, හිංදු සාදනම්
   (2) ශෛවසිද්ධාන්ත බානු, විවේකානන්දන්, ශිවතොණ්ඩන්
   (3) ශිවතොණ්ඩන්, ඉලංගයි නේසන්, ශෛවක්කාවලන්
   (4) ශෛවසිද්ධාන්ත බානු, ශෛවක්කාවලන්, උදයතාරගයි
   (5) ශිවතොණ්ඩන්, ශෛවසිද්ධාන්ත බානු, හිංදු සාදනම්

23. නම්මාල්වාර් ගැයූ ගීතිකා ඇතුළත් කාණ්ඩය
   (1) තිරුවිරුත්තම්, තිරුවාසිරියම්, පෙරියතිරුවන්දාදි, තිරුවායිමොලි
   (2) තිරුවාසිරියම්, තිරුවායිමොලි, තිරුප්පාවයි, තිරුවිරුත්තම්
   (3) පෙරියතිරුවන්දාදි, පෙරියාල්වාර්, තිරුමොලි, තිරුවිරුත්තම්, තිරුවාසිරියම්
   (4) තිරුප්පල්ලාණ්ඩු, තිරුවාසිරියම්, තිරුවායිමොලි, තිරුවිරුත්තම්
   (5) තිරුප්පාවයි, පෙරියතිරුවන්දාදි, තිරුවායිමොලි, තිරුවිරුත්තම්

24. 20 වැනි සියවසේ ශ්‍රී ලංකාවේ ශෛව ආගමික වර්ධනය සඳහා සේවා ඉටු කළ ආයතන,
   (1) විවේකානන්ද සභාව, යාපනයේ ශෛව පරිපාලන සභාව, ආර්ය සමාජය
   (2) විවේකානන්ද සභාව, ශෛව විද්‍යා විරුත්ති සංගමය, ශෛව මංගයර් කලහම්
   (3) හලාවත හින්දු යෞවන සමාජය, ශෛව මංගයර් කලහම්, ශෛව ප්‍රකාශ සභාව
   (4) විවේකානන්ද සභාව, රාම ක්‍රිෂ්ණ මිෂන්, ශෛව ප්‍රකාශ සමාජය
   (5) අහිල ඉලංගයි හිංදු මාමන්ඩ්‍රම්, ශෛව මංගයර් කලහම්, ශෛව ප්‍රකාශ සභාව

25. පහත සඳහන් ඒවායින් 'තිරුක්කුරල්' පිළිබඳ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
   (1) මෙය සංගමරුවිය යුගයට අයත් ග්‍රන්ථයක් ලෙස සැලකේ.
   (2) විනයට වැදගත් ස්ථානයක් ලබා දී ඇති ග්‍රන්ථයකි.
   (3) මෙහි සම්පත් උපයා ගැනීමට සහ එය භුක්ති විඳීමට ඉවහල් වන්නේ රාජ නීතිය බව පවසා ඇත.
   (4) මෙම ග්‍රන්ථයෙහි කාන්තාවන් පිරිමින්ට සමාන අය ලෙස දක්වා ඇත.
   (5) කෙනෙකු ගිහි පැවිදි යන මාර්ග දෙක ම අනුගමනය කළ ද තමන් කළ පූර්ව ක්‍රියාවල ප්‍රතිඵලය විඳිය යුතු වන බව මෙයින් කියැවේ.

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව ප්‍රකාශ පහ බැගින් දී ඇත. ඒවායින් දී ඇති මාතෘකාවට **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

26. **සපුපති වෙට්ටියාර්**
   (1) ශෛව පරිපාලන සභාවේ භාණ්ඩාගාරික වේ.
   (2) හින්දු යෞවන සමාජය පිහිටුවනු ලැබී ය.
   (3) තිරුක්කේදීශ්වරම් දේවාල ඉදි කිරීම් කටයුතුවල නිරත වූවෙකි.
   (4) මොහු ශෛව විද්‍යා විරුත්ති සංගම්හි නිර්මාතෘවරයා ය.
   (5) යාපනයේ හින්දු විද්‍යාලයේ නිර්මාතෘවරුන්ගෙන් කෙනෙකි.

27. **'පන්නිසෛ' හි විශේෂත්වය**
(1) 'තේවාර මුදලින්' විසින් පන්නිසෛ වර්ධනය කරනු ලැබී ය.
(2) කර්ණාටක සංගීතයේ ස්වරය, රාගය යනුවෙන් හැඳින්වේ.
(3) මෙය විජය නගර අධිරාජ්‍ය යුගයේ තමිල්නාඩුවට හඳුන්වා දෙනු ලැබී ය.
(4) තේරු උත්සව කාලයේ දී 'නවසන්දිප්පන්' ගායනා කිරීම ප්‍රධාන තැනක් ගනී.
(5) 'පංචමරබු' යන ග්‍රන්ථය පන්නිසෛ පිළිබඳ ව විස්තර කරන වැදගත් ග්‍රන්ථයක් වේ.

28. **තීට්සෛ**
(1) ආගමික තීට්සෛ, ප්‍රවේශ තීට්සෛ යනුවෙන් ද හඳුන්වනු ලබයි.
(2) නිර්වාණ තීට්සෛවලට වඩා විශේෂ තීට්සෛ ගරුත්වයෙන් වැඩි ය.
(3) තීට්සෛ ලබා දීමේ සුදුසුකම ඇත්තේ ආචාර්ය අභිෂේගම් ලත් ඇදුරෙකුට ය.
(4) උරුත්තිරාක්කම් පැලඳීමේ සුදුසුකම තිබෙන්නේ ආගමික තීට්සෛ ලබා ගත් අයට පමණි.
(5) තීට්සෛ යනු පාසම් නැතිකර ඥානය ලබාදෙන පිළිවෙතයි.

29. **ශෛව සිද්ධාන්තයේ ආණවම්**
(1) අඳුරට වඩා දරුණු බව කියැවේ.
(2) ආත්මයේ ගතිලක්ෂණයක් ලෙස පවතී.
(3) 'ආගන්දයි හා මමදයි' ට හේතු වෙයි.
(4) ආත්මයට අඩු ඥානයක් ඇති කරන අතර වැරදි ක්‍රියා කිරීමට දිරි ගන්වයි.
(5) විගට්පම්, කට්පම් වැනි ගුණාංග අටකින් සමන්විතයි.

30. **ධර්මපුර ආදීනම්**
(1) ක්‍රි.ව. 1560 වර්ෂයේ නමසිවාය මූර්තිහල් විසින් බිහි කරනු ලැබූවකි.
(2) ඥානසම්බන්දන් යන මාසික සඟරාව ප්‍රකාශයට පත් කරනු ලැබේ.
(3) සිද්ධාන්ත විද්‍යාල ස්ථාපිත කර ශෛව සිද්ධාන්ත අදහස් ප්‍රචාරය කෙරේ.
(4) තේවාර පාසල් ස්ථාපිත කර දේව භාෂාව වන දෙමළ වර්ධනය කරයි.
(5) තංජෛ දිස්ත්‍රික්කයේ මයිලාඩුතුරයිට නැගෙනහිරින් පිහිටා ඇත.

- පහත දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| උදයගිරි | ඊසාන පණ්ඩිදර් | මානසාරම් | ජලසයනම් | ගුරුඥාන සම්බන්දර් |
| **F** | **G** | **H** | **I** | **J** |
| ආගමම් | රාජසිම්මන් | ඊරන් | වේද වර්ධනය | සිත්තාන්ද සිගාමනි |

31. හිංදු පිළිම කලාව හා සම්බන්ධ කරුණු ඇතුළත් කාණ්ඩය,
(1) A G (2) C F (3) C G (4) D F (5) D G

32. නායක්කර් යුගයේ ශෛව ආදීනම් හා සම්බන්ධ කාණ්ඩය,
(1) A H (2) B J (3) C H (4) E I (5) E J

33. ගුහා දේවාල හා සම්බන්ධ කාණ්ඩය,
(1) A G (2) A H (3) B F (4) D H (5) D I

34. චෝල යුගයේ හිංදු ආගමික වර්ධනය හා සම්බන්ධ කාණ්ඩය,
(1) A I (2) B I (3) B J (4) E G (5) E J

35. පල්ලව යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය හා සම්බන්ධ කාණ්ඩය,
(1) A F (2) A G (3) B I (4) P G (5) E G

● හින්දු ආගම විස්තර කරන විනෛ සහ ධර්මය පිළිබඳ කරුණු කිහිපයක් පහත දී ඇත. ඒවා ඇසුරෙන්, අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

**ශෛව සිද්ධාන්තයට අනුව 'විනෛ'**

A - ශෛව සිද්ධාන්තයට අනුව ප්‍රාරත්තුව විනෛ, විදි, නියදි, ඌල් දෙයිවම් යන නම්වලින් හඳුන්වනු ලබයි.

B - නොසිතා කරනු ලබන ක්‍රියාව 'පට්ට්‍රට්ර විනෛ' හෝ 'නිශ්කාමිය කර්මම්' යනුවෙන් හඳුන්වනු ලබයි. මෙය ප්‍රතිඵලයක් ඇති නො කරයි.

C - 'ආදි දෙයිවිගම්', 'ආදි බෞදිගම්' 'ආදි ආත්මිගම්' යන වර්ග තුන මගින් ප්‍රාරත්තුව විනෛ අත්දැකීමක් බවට පත් වේ.

D - කෙනෙකු මෙම ආත්මයේ ප්‍රාරත්තුව විනෛවල ප්‍රතිඵලය භුක්ති විඳීමේ දී ඔහු විසින් කරනු ලබන නව විනෛ ආගාමියම් නම් වේ. මෙය 'එදිර් විනෛ' නැතහොත් 'නව විනෛ' යනුවෙන් ද හැඳින්වේ.

E - කෙනෙකුට මෙම ආත්මයේ දී ආගාමියම් තීරණය කිරීමේ අයිතිය ඇත.

F - 'වෙරුවිනෛහල්' ද ප්‍රතිඵල නො ගෙනෙන ක්‍රියා වේ.

36. ශෛව සිද්ධාන්ත දැක්මේ දෛවය (විදි) හා සම්බන්ධ ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A C (2) A D (3) B E (4) C D (5) C F

37. ශෛව සිද්ධාන්ත අනුව එදිර් විනෛ යන දර්ශනය හා සම්බන්ධ ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A B (2) B F (3) C E (4) D E (5) D F

38. ශෛව සිද්ධාන්තය අනුව ඉපදීම ඇති කරන ක්‍රියා සමග විනෛ සම්බන්ධ **නො වන** ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A D (2) B F (3) C D (4) D E (5) E F

**ඖවයාර්**

A - සංග යුගයේ ඖවයාර්, අදියමාන් රජුගෙන් නෙල්ලි ගෙඩියක් ලබා ගත්තා ය.

B - 'තිරුවල්ලුවර් කදෛ, කබිලරගවල්, සහ ඥානාම්ර්දම්' යන ග්‍රන්ථවල ඖවයාර් පිළිබඳ තොරතුරු සඳහන් වේ.

C - 'ආත්තිසූඩි' ග්‍රන්ථය ධර්ම 108ක් පිළිබඳව විස්තර කරයි. මෙයට 'අෂ්ටෝත්තිර නීදිනූල්' යන නම ද භාවිත කෙරේ.

D - 'නල්වලි' නම් ග්‍රන්ථයෙන් විභූතිවල වැදගත්කම, සාධාරණත්වය, පරදාර සේවනය නොකිරීම, පිං කිරීමේ අවශ්‍යතාව වැනි වැදගත් කරුණු පිළිබඳ ව පැහැදිලි කෙරේ.

39. ඖවයාර්ගේ ඉතිහාසය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A B (2) A C (3) A D (4) B C (5) B D

40. ඖවයාර්ගේ ග්‍රන්ථවල බහුලව දක්නට ලැබෙන විද්‍යාත්මක තොරතුරු හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A C (2) A D (3) B C (4) B D (5) C D

● ප්‍රශ්න අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළව මාතෘකාවක් යටතේ කරුණු පහක් දී ඇත. ඒවායින් මාතෘකාවට වඩාත් සුදුසු ප්‍රකාශය තෝරන්න.

41. **භගවත් ගීතාවේ කර්මයෝගය**
(1) 'දාස්යම්' වැනි භාව හයක් මගින් කියැවේ.
(2) 13 සිට 18ක් වැනි පරිච්ඡේදය දක්වා වූ කොටසේ විස්තරාත්මකව පැහැදිලි කර ඇත.
(3) 'ආසාර භක්තිය' සහ 'ප්‍රභක්තිය' යනුවෙන් මට්ටම් දෙකක් ඇත.
(4) ශ්‍රී ක්‍රිෂ්ණ දෙවියන් ස්වධර්මය මගින් පැහැදිලි කර ඇත.
(5) 'පරවිත්තෛ' හා 'අපරවිත්තෛ' පිළිබඳ ව විශේෂයෙන් පැහැදිලි කරයි.

42. **'ඥානම්'**
(1) සංකර්ගේ 'අත්වෛදම්' විමුක්තිය ලබා ගැනීමට වැදගත් ම මාර්ගය 'ඥානම්' බව පවසයි.
(2) 'පිරකිරුදි' , 'පුරුෂන්' යන ඒවායින් එකක් පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා ගැනීම 'ඥානය' බව භගවත් ගීතාව සඳහන් කරයි.
(3) ආත්මාර්තකාමී නො වන ආදර මාර්ගය ඥාන වේ.
(4) 'බ්‍රම ඥානම්', 'අපර විත්තෛ' යනුවෙන් ද හැඳින්වේ.
(5) ශෛව සිද්ධාන්තයේ 'ඥනම්' යන්න 'අරුවුරුව තිරුමේනි' වන්දනා කිරීම බව පවසයි.

43. **ආශ්‍රම ධර්ම**
(1) 'වානප්‍රස්ත අවධිය' යනු සන්‍යාසි අවධියේ පුහුණු කාලයයි.
(2) 'පිදිර්යක්ඥම්' යනු රූප හැඩයෙන් යුත් දෙවියන්ට කරනු ලබන වන්දනාවයි.
(3) ගුරුකුල අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ ශිෂ්‍යයාට ලෞකික අත්දැකීම් ලබා දීමයි.
(4) යාග වර්ග පහ පැවැත්විය යුත්තේ සන්‍යාසි අවධියේ සිටින අය විසිනි.
(5) හින්දු බැතිමතෙකුගේ ජීවිතයේ තුන්වන අවධිය 'ගෘහස්ථම්' වේ.

44. **දක්ෂිණාමූර්තිගෙන් ප්‍රකාශ වන දර්ශනය,**
   (1) ශිව දේවාලවල දකුණු දිශාව බලා ගෙන සිටින මූර්තියයි.
   (2) දෙවියන් ඇදුරු කෙනකු ලෙස පෙන්නුම් කළ රූපයක් වන මෙය ශිව මූර්තවලින් එකක් ලෙස පවතී.
   (3) ව්‍යාඛ්‍යාන දක්ෂිණාමූර්ති ශිව දේවාලවල බහුලව දක්නට ලැබේ.
   (4) 'පසු' පාසම්වලින් ඇත්වූ 'පදි' ළඟා වීම පැහැදිලි කරයි.
   (5) යෝග දක්ෂිණාමූර්ති, ඥාන දක්ෂිණාමූර්ති, ව්‍යාඛ්‍යාන දක්ෂිණාමූර්ති සහ වීණාදර දක්ෂිණාමූර්ති' යනුවෙන් වර්ග හතරකින් යුක්ත වේ.

45. **බ්‍රහ්ම සූත්‍රය**
   (1) පාදරායනර් විසින් රචනා කරන ලදී.
   (2) තාර්කික ක්‍රමවලට ප්‍රවේශය සපයයි.
   (3) 'වේදාන්ත සූත්‍රම්' යන නමින් ද හැඳින්වේ.
   (4) බ්‍රහ්මා වන ප්‍රධාන දෙවියන් ගැන පද්‍ය මගින් පැහැදිලි කෙරෙන ග්‍රන්ථයයි.
   (5) ලෝකය බිහිවීම, බ්‍රහ්ම ඥානය ලබා ගැනීමේ ක්‍රම පැහැදිලි කරයි.

46. **ශාන්ත භාවය**
   (1) යහළුවන් අතර පවතින උසස් ම මිත්‍රත්වයයි.
   (2) බිරිඳක විසින් තම ස්වාමි පුරුෂයාට දක්වන ආදරයයි.
   (3) පෙම්වතුන් අතර පවත්නා ආදරයයි.
   (4) දරුවකු තම මවට කරන ආදරයයි.
   (5) මවක් තම දරුවකුට කරන ආදරයයි.

47. සංඥානනය
   (1) සංඥානනය මගින් ලබා ගන්නා දැනුම මාධ්‍ය දැනුමක් වේ.
   (2) හේදු දැනුම මිට්ටම්වලින් එකකි.
   (3) යමක් එහි විශේෂාංග ගුණාංග සමග දැන ගැනීම සවිකල්ප වේ.
   (4) සංඥානනය 'ආගම අලවෙ' යනුවෙන් ද හඳුන්වයි.
   (5) මන්ත්‍ර, තන්ත්‍ර, උපදේශම් යන වර්ග තුනකින් යුක්ත ය.

48. **කන්නගි අම්මන් වන්දනාව**
   (1) මෙම වන්දනාවේ බිහිවීම හා වැදගත්කම මණිමේගලෛ කතාවෙන් ඇරඹිණි.
   (2) සේරන් සෙංගුට්ටුවන් රජතුමා ක්‍රි.ව. 5 වන සියවසේ කන්නගි දෙවියන් වෙනුවෙන් උත්සව පැවැත්වී ය.
   (3) ගම ආරක්ෂා කිරීම, පූජා ද්‍රව්‍ය තැබීම යන ඒවා අවසාන දින පිළිවෙතක් ලෙස සිදු කෙරේ.
   (4) ලෙඩරෝග දුරු කිරීම, වැසි ලබා ගැනීම, බිය තුරන් කිරීම ආදිය සඳහා කන්නගි අම්මන් වන්දනාව කෙරේ.
   (5) කන්නගි වන්දනාවේ දේවාල දොර විවෘත කිරීමෙන් පසු පොත කියවීම නො කෙරේ.

49. **බෝගි උත්සවය**
   (1) මෙය සමරනු ලබන්නේ අනවශ්‍ය දේවල් ඉවත් කිරීම හා අළුත් දේවල් එකතුකර ගැනීම යන අදහස මුල් කර ගෙන ය.
   (2) සූර්යයා ධනු රාශියේ සිට මකර රාශියට යන දවස වේ.
   (3) මෙය සූර්යයාට ස්තුති කරන දවසක් ලෙස සැලකේ.
   (4) ගවයන් අලංකරණය කර, කවා පොවා වන්දනා කරන දවසයි.
   (5) මෙය ගොවියාගේ උත්සව දවස ලෙස හැඳින්වේ.

50. **හින්දු ආගමික වෛද්‍ය ක්‍රමය**
   (1) ආත්තිරේයර් ආයුර්වේද ග්‍රන්ථයක් රචනා කළේ ය.
   (2) රාමායනයේ මෘත්සංජීවනි ඖෂධය ගැන විස්තර කරයි.
   (3) අතර්ව වේදයේ පේෂජානි සූක්තම්, ආයුෂ්‍යානි සූක්තම්, වැනි කොටස්වල වෛද්‍ය චින්තන ඇතුළත් ය.
   (4) සරගසම්හිදෙයිහි ලෙඩ රෝග 149ක් හා එම රෝග ලක්ෂණ, ප්‍රතිකාර ක්‍රම යනාදිය පිළිබඳ ව විස්තර කෙරේ.
   (5) තෝප්පුකරණම් කිරීම, අට්ඨාංග හා පංචාංග නමස්කාරය, ගිරිවලම් යාම මගින් ලෙඩරෝග සුව වේ.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| හින්දු ධර්මය II<br>இந்து சமயம் II<br>Hinduism II | 42 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**

✻ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. හින්දු ආගමික සාහිත්‍යයේ 'වේදම්' ඉතා පැරණිතම ශුද්ධ වූ ග්‍රන්ථ වේ.
   (අ) 'වේදම්' යන්නෙහි තේරුම කුමක් ද?
   (ආ) වේදම් හැඳින්වෙන වෙනත් නම් මොනවා ද?
   (ඉ) වේද කාලයේ පැවති ආගමික පරිසරය පිළිබඳව පැහැදිලි කරන්න.
   (ඊ) ඍග්වේදයේ දාර්ශනික අදහස් පිළිබඳ ව විස්තර කරන්න.

2. සිවාගමම්, ශෛව දේවාල ගෘහ නිර්මාණ ක්‍රම සහ ශිව දේවාල පුද පූජා ක්‍රම පිළිබඳව මනාව පැහැදිලි කරයි.
   (අ) 'ආගමම්' හි විශේෂ ලක්ෂණ සඳහන් කරන්න.
   (ආ) ආගමම් මගින් විස්තර කෙරෙන තේරුම් සම්ප්‍රදාය පිළිබඳ ව පැහැදිලි කරන්න.
   (ඉ) ශිවාගමම් විස්තර කරන දේවාල ගෘහ නිර්මාණ ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
   (ඊ) 'කොඩියේට්ට්‍රම්' නම් ආගමික කටයුත්ත පිළිබඳව ශෛව සිද්ධාන්තම් මගින් පැහැදිලි කෙරෙන්නේ කුමක් ද'යි විස්තර කරන්න.

3. හින්දු ආගමික ඉතිහාසයේ විජය නගර යුගය සුවිශේෂ වේ.
   (අ) විජය නගර අධිරාජ්‍යය බිහි වූ පසුබිම පිළිබඳ ව පැහැදිලි කරන්න.
   (ආ) විජය නගර යුගයේ පැවැති 'ශෛවම්' සහ 'වෛශ්නව' පිළිබඳ ව පැහැදිලි කරන්න.
   (ඉ) විජය නගර යුගයේ පැවති 'මඩම්' සහ 'ආදීනංගල්' පිළිබඳ ව විස්තර කරන්න.
   (ඊ) විජය නගර යුගයේ කලා සම්ප්‍රදාය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

## II කොටස

4. "බ්‍රමම්හි ඒකීය බවත්, ලෝකය සත්‍ය නො වන බවත්, ආත්මය බ්‍රමම්ගෙන් වෙන් වූවක් නො වන බවත් පැහැදිලි කිරීම සංකරර්ගේ අත්වෛද වේදාන්ත දර්ශනයේ මූලික පදනම වේ." මෙම ප්‍රකාශයට අනුව පහත සඳහන් ඒවා පැහැදිලි කරන්න.
   (අ) සංකරර් පිළිගන්නා 'ප්‍රමාණංගල්' (ආ) අවච්චේද වාදම්
   (ඉ) පිරදිවිම්භ වාදම් (ඊ) විවර්ත වාදම්

5. ශෛව සිද්ධාන්තම් පැහැදිලි කරන 'පදි මතය' පහත සඳහන් මාතෘකා යටතේ විමසන්න.
   (අ) 'ශෛව සිද්ධාන්තම්' යන්නෙහි තේරුම
   (ආ) ශෛව සිද්ධාන්තයේ දේව සත්‍යතාව
   (ඉ) සොරූහ ලක්ඛණම්
   (ඊ) තඩත්ත ලක්ඛණම්

6. හින්දු භක්තිකයකුගේ ශාරීරික හා මානසික වර්ධනයට 'යෝග' දර්ශනය ඉවහල් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න.

7. "හින්දු ආගමික ධර්මවලින් සාක්තම් සංස්කෘතිකමය වශයෙන් සුවිශේෂත්වයක් ගනී." මෙය පදනම් කරගෙන පහත සඳහන් ඒවා පැහැදිලි කරන්න.
   (අ) 'සාක්තම්' යන්නෙහි තේරුම (ආ) ශ්‍රී චක්‍ර වන්දනාව
   (ඉ) ශක්ති උපවාස (ඊ) ශක්ති දේවාල

8. පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
   (අ) තිරුමූලර් (ආ) ශිව රාත්‍රි
   (ඉ) කාවඩි (ඊ) අන්නමාර් වන්දනාව
   (උ) තිරුක්කෝවිල් සිත්තිර වේලායුද ස්වාමි කෝවිල (ඌ) හින්දු පෝර්ට් සු. රාසරත්තිනම්

✻✻✻